**පූනකරි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**
----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 05 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 18 වන දිනද සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පූනකරි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් **පිළිබිඹු** කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම
----------------------------------

ප්‍රවර්ථන වර්ෂයේදී සභාව මඟින් දරන ලද එකතුව වූ රු. 46,993 ක්වූ වියදම් දෙකකට අදාලව ඉන්වොයිස්පත්‍ර විගණනයට ලබා නොදීම හේතුවෙන් එම වියදම සම්බන්ධව විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

1.3.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්
-----------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම් පහත දැක්වෙන ලෙස විගනනයේදී අවදාරණය විය

| | නීති, රීති, රෙගුලාසි හා මුදල් රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ III කොටසෙහි 24 වන වගන්තිය | ප්‍රාදේශිය සභාව ස්ථාපිත කර අවුරුදු 03 ක් ඇතුලත ප්‍රාද්ශිය සභාවට අයත් මංමාවත් හා පටු මාවත් වල දැන්වීමක් රජයේ ගැසට් පත්‍රයේ පල කිරීමට අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි. |

(ආ) 1988 ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන නීති

| | | |
|---|---|---|
| | III වන පරිච්ඡේදයෙහි රීති අංක 66 | |
| (I) | | එකතුව වූ රු. 6,036,445 ක්වූ හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| (II) | V වන පරිච්ඡේදයෙහි රීති අංක 140 | නියමිත කාලය තුලදී පියවා නොතිබූ රු.100,000 ක්වූ අතුරු ආග්‍රිමයක් සම්බන්ධයෙන් සභාව කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. |
| (iii) | VIII වන පරිච්ඡේදයෙහි රීති අංක 178 (3) | කර්මාන්ත ඉදිකිරීමෙහි හැකියාව සහිත ග්‍රාමෝදය මණ්ඩල හා වෙනත් අනුමත ආයතන පිළිබඳ නාම ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iv) | VIII වන පරිච්ඡේදයෙහි රීති අංක 178 (5) | ටෙන්ඩර් කැඳවීම් ලිපි ලියාපදිංචි තැපැල් මගින් හෝ සභාපතිවරයා බලය පැවරූ අයකු විසින් නිවේදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (III) | IX වන පරිච්ඡේදයෙහි රීති අංක 180 | මුදල් හා ගබඩා කටයුතු භාරව ක්‍රියා කරන නිළධාරීන්ගෙන් ඇපකර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| I | අංක 396 (ඇ) | ප්‍රවර්ථන වර්ෂයට අදාල කල් ඉකුත් වූ එකතුව රු.73,018 ක වටිනාකමැති චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. |
| II | අංක 571 | වර්ෂ දෙකකට වැඩි කාලයකට අයත් එකතුව රු. 5,092,511 ක්වූ තැන්පතු 54 ක් සම්බන්ධයෙන් සභාව විසින් ප්‍රමාණවත් පියවරයන් ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාසභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 5,012,326 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 6,665,869 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලය රු. 1,653,543 ක පහත බැසීමක් දක්නට ලැබුණි.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 අයවැයගත ආදායම, තත්‍ය ආදායම හා හිඟහිටි ආදායම

------------------------------------------------------------

සභාපතිවරයා විසින් ප්‍රවර්ථන වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැයගත ආදායම, තත්‍ය ආදායම හා හිඟහිටි ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2016

| ආදායම් අයිතමය | අයවැයගත ආදායම | තත්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් බදු | - | 33,675 | - |
| කඩකුලී හා ලීසිං | 3,450,030 | 1,373,999 | 602,700 |
| බලපත්‍ර ගාස්තු | 562,600 | 665,935 | - |
| අනෙකුත් ආදායම් | 38,172,394 | 25,346,451 | 2,738,658 |
| | 42,185,024 | 27,420,060 | 3,341,358 |

2.2.2 මුද්දර ගාස්තු

--------------

ඉඩම් රෙජිස්ටාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව වෙතින් සභාවට අයවිය යුතු එකතුව රු. 4,330,844 ක්වූ මුද්දර ගාස්තුව වර්ෂ 1 සිට වර්ෂ 6 දක්වා අයකර ගැනීමට සභාව විසින් සැලකිය යුතු පියවරයන් ගෙන නොතිබුණි.

2.2.3 ලැබිය යුතු දෑ

---------------

ආදායම් ණයගැති ගිණුම් වල පෙන්නුම් කරන ලැබිය යුතු ආදායම් අයිතම 7 කට අදාල රු.508,360 ක් වර්ෂ 1 සිට වර්ෂ 6 දක්වා අයකර ගැනීමට සභාව විසින් සැලකිය යුතු පියවරයන් ගෙන නොතිබුණි.

2.2.4 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

-------------------------------------

අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති ශ්‍රී ලංකා අතිවිශේෂ ගැසට් පත්‍රය පරිදි සභා බල ප්‍රදේශය තුල ඉදිකරන ලද දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 04 කට අදාලව වර්ග හතරක ගාස්තු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණු අතර අයවිය යුතු ගාස්තු ගණනය කර ගිණුම් වලටද ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

වර්ෂ 1 සිට වර්ෂ 7 දක්වා කාලය තුල සභාව විසින් භාවිතා කරනු ලබන සභාව වෙත පරිත්‍යාග ලෙස ලැබුණු වාහන 32 කට අදාලව අයිතිය සභාවේ නමට මාරු කර ගැනීමට සභාව විසින් කිසිදු පියවරයක් ගෙන නොතිබුණි.

3.2 සේවක පුරප්පාඩු

සභාවෙහි සේවක පුරප්පාඩු 27 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර එය සභාවේ වැඩ කටයුතු වලට බාධා නොවෙනවාය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

3.3 ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන්

ප්‍රවර්ථන වර්ෂයේදී හා ඊට පෙර වර්ෂ වලදී ආරම්භ කරන ලද ව්‍යාපෘති 07 කට අදාල එකතුව වූ රු. 3,124,734 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කර තිබුණද, සභාව විසින් උක්ත ව්‍යාපෘති නිම කිරීමට කිසිදු පියවරක් අද දක්වා ගෙන නොතිබුණි.

3.4. ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය

සභා බල **ප්‍රදේශය** තුල එකතු වන කුණු ගිණි තබා විනාශ කිරීම හා පස් දැමීම ආදී කටයුතු පමණක් සභාව විසින් සිදුකරන අතර කොම්පෝස්ට් පොහොර සෑදීම හා අපද්‍රව්‍ය නැවත භාවිතයට ගැනීම් යනාදිය ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ කටයුතු සිදු කිරීමට සභාව විසින් කිසිදු පියවරයන් ගෙන නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

4.1 අභ්‍යන්තර විගණනය

සභාවේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර අභ්‍යන්තර පාලනයක් ඇතිකර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන ඒකකයක්ද ස්ථාපිත කර නොතිබුණි.

4.2 අයවැය පාලනය

නියමිත පරිදි අයවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම හේතුවෙන් අයවැයගත ආදායමත් තත්‍ය ආදායමත් අතර රු. 14,764,964 ක වෙනසක් දක්නට ලැබුණු අතර අයවැයගත වියදමත් තත්‍ය වියදමත් අතර රු. 17,000,560 ක වෙනසක්ද දක්නට ලැබුණි.

5. පද්ධති හා පාලන

පහත දෑ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

- i හිඟහිටි ආදායම් අයකර ගැනීම
- ii වාහන භාවිතය
- iii කොන්ත්‍රාත් පරිපාලනය
- iv ආදායම් ගිණුම්ගත කිරීම
- v කම්කරුවන් අධීක්ෂණය